# ගව සම්පත දියුණු වේවා

වැල්ලැවේ එච්. පුංචිබණ්ඩාර විසිනි

1. පිටරට සිටන් එන පිටි කළ කිරි බොන්     න
සුදනම් නොවී එය අප නිපදන්     න
ගව සම්පත නැවත හෙලයෙහි රැක ගන්     න
ඔබ සැමදෙනා අද සිට සිහියට ගන්     න

2. පස් ගෝ රසය ගෙන සවි බලඇති පුත්     තු
විලසට වැඩෙන්නට නාලාගිරි ඇත්     තු
රැක ගන්නට අපේ නිදහස ලැබ ගත්     තු
ඔබ විය යුතුය ගව සම්පතෙ පොහොසත්     තු

3. හැම වත්තකම අහලක් ඇත් නම් මුඩු     ව
නොතබනු මැනව එය කිසිවිට තණ අඩු     ව
ගවයගෙ ගතට ගුණදී ඇඟ පතවැඩු     ව
ගිණි තණ කොළයි වැවුමට හොඳ බව දෙඩු     ව

4. ඕවිටි ඇතොත් අස්වැද්දූම් නොකර කි     සි
හැරුමට යුතු නොවේ වල් පැල වලින් වැ     සි
කිරිදෙන සැම එළදෙනෙකුට බුදිනු රි     සි
නේපියර වර්ගයේ තණ කොල වැවුම නි     සි

5. දියරැලි මඩ වගුරු බිම් වල කැලෑ පැ     ල
වැවිලා ඉහළ යාමෙන් කිම ලැබෙන ප     ල
ඔබෙ ගවයාට කැමට හොඳ නොමැති මී     ල
දිය තණ කොළ වවනු ඔවුනට ලැබෙන බ     ල

6. හොඳ හරකුන් ලබන්නට ගත සවිය ඇ ති
වල් පොඩි හරක් බෝවීමට නොදිය යු ති
ඒ පොඩි හරක් තර කෙරුමට බලය ඇ ති
ඔබෙ වස්සා කර අඹලා දැමිය යු ති

7. බෝකර ගන්න හොඳ ගවයින් ඔබෙ ගම ට
තුටුනම් රජය සූදනම් සියලු වි ට
හොඳ මාදිලියෙ ගවයෙක් තුමු ලැබීම ට
දැන්විය යුතුය ගොවිකම් නිල දරයින් ට

8. හොඳ මාදිලියෙ ගව පැටවෙක් එළදෙන ට
ගවයෙක් නැතුව තුටුනම් ලැබ ගැනීම ට
ඔබෙ පෙදෙසේ ගොවි නිලදර තුමා හ ට
දන්වනු මැනවි ඒමට නිසි වෙලාව ට

9. කිරිද ගිතෙල් පස් ගෝ රස නිපදේ වා
ගව සම්පතින් කිසි අඩුවක් නොම වේ වා
හැම දෙන හටම සැම සම්පත් වැඩි වේ වා
මගෙ " ලක්මවට " නිති කිරිපැණි ඉතිරේ වා

**පාඨකයින්ගේ දැනගැනීම සඳහායි**

ගොවිකම් සඟරාවේ පළකිරීම සඳහා තෝරාගනු ලබන ලිපි සඳහා 1968 ජනවාරි මාසයේ පටන් පහත දක්වා ඇති අයුරින් ගෙවීම් කරනු ලැබේ.

ජනප්‍රිය ලිපි :—මුද්‍රිත පිටුවකට රුපියල් .. .. 7.50

කවි පන්ති :—පේළි හතරේ කවි 10ක් සඳහා රුපියල් .. 15.00

පරිවර්තන කිරීම සඳහා ඉංග්‍රීසියෙන් සපයනනලද විද්‍යාත්මක ලිපි මුද්‍රිත පිටුවකට රුපියල් .. .. 10.00

සිංහලෙන් සපයන ලද විද්‍යාත්මක ලිපි මුද්‍රිත පිටුවකට රුපියල් 15.00


3—එච 7079 (67/9)